# කම්මැළි තාරා පැටියා



අශ්මි මෙතුසරී බණ්ඩාර



# කම්මැළි තාරා පැටියා


ප්‍රථම එළිදැක්වීම - 15.11.2023

ISBN 978-624-206-634-9



අශ්මි මෙතුසරි බණ්ඩාර

# පිදුම

මෙම පොත

මාගේ පන්තියේ

**මිතුරියන් වෙනුවෙන්**

පුදකරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023.11.01**

එකමත් එක කාලෙක ලස්සන ගොවිපලක් තිබුණා. ඒ ගොවිපලේ තාරා අම්මා කෙනෙකුයි අප්පච්චි කෙනෙකුයි හිටියා. තාරා අම්මා දවසක් බිත්තර හතරක් දැම්මා.



තාරා බිත්තරවලින් තාරා පැටව් හතර දෙනෙක් එළියට ආවා. තාරා අම්මටයි අප්පච්චිටයි හරි සතුටුයි.




තාරා පැටව්, ටික ටික ලොකු වුණා. දැන් මේ ලස්සන තාරා පැටවුන්ට පීනන්න කාලය හරි, තාරා අම්මා හිතුවා.

''පැටවුනේ දැන් පීනන්න ඉගෙන ගන්න ඕනේ. අපි හෙට උදේම පීනන්න පොකුණට යනවා'' කියලා තාරා අම්මා කිව්වා.



තාරා පැටවු තුන් දෙනෙක් උදෙන්ම අවදි වුණා. හරි සතුටින් පීනන්න ඉගෙන ගන්න ලෑස්ති වුණා. තාරා අම්මා පැටවුන්ට කතා කළා.



පැටව් තුන්දෙනෙක් හරි සතුටින් එළියට ආවා. ඒත්, එක තාරා පැටියෙක් තාමත් අවදි වී නෑ. කම්මැලි තාරා පැටියාට තරහා ගියා. එයා ආයෙත් නිදා ගත්තා. තාරා අම්මයි අනෙක් තාරා පැටව් තුන්දෙනයි පීනන්න පොකුණට ගියා.



තාරා පැටව් තුන්දෙනා සතුටින් වතුරට බැස්සා. තාරා අම්මා පැටවුන්ට පීනන්න කියා දුන්නා. පොකුණේ සිටි මාළුවන් තාරා පැටව් පීනන දිහා බලා සිටියා. තාරා පැටවුන්ට හරි සතුටුයි.



කම්මැලි තාරා පැටියා ගොවිපලට වෙලා දවල් වෙනතුරු නිදා ගත්තා. අනිත් තාරා පැටව් තුන්දෙනා සතුටින් ගෙදර ගියා.

තාරා අම්මා කම්මැලි තාරා පැටියාට එදා දවසේ විස්තර රස කර කිව්වා.



දවසක් මේ කම්මැලි තාරා පැටියා ගසක් යට නිදා සිටින විට නපුරු රාජාලියෙක් පැටියාව දැක්කා. රාජාලියා පැටියාව අල්ලන්න ළං වුණා. හැබැයි කම්මැලි තාරා පැටියාට පීනන්න ඕනෑ වුනත් පීනන්න දන්නේ නැහැ. හොඳ වේලාවට තාරා සීයයි අච්චියි මේක දැකලා පැටියාව බේරා ගත්තා.



මේ සිද්ධියෙන් පස්සේ තාරා පැටියා බොහෝම බය වුනා. තාරා අම්මයි තාත්තයි තාරා පැටියාට බොහෝම කරුණාවෙන් අවවාද කළා.



එදායින් පසු තාරා පැටියා කම්මැලි නැති, කඩිසර තාරා පැටියෙක් වෙන්න සිතා ගත්තා. විලේ සිටිය සියළුම සතුන් තාරා පැටියාගේ යහළුවෝ වුනා.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

**මෙයට**
**සෙනෙවිරත්න මහලේකම්**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**
**2023.11.01**

